# තණමල්විල ප්‍රාදේශීය සභාව
# මොණරාගල දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 18 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව තණමල්විල ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා තිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට තණමල්විල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සභාවේ කැබ් රථය අළුත්වැඩියාව සඳහා ලැබී තිබුණ රු.1,174,350 ක් මූලධන ආධාර යටතේ ගිණුම් ගත නොකර වෙනත් ආදායම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ආ) ලංකා විදුලිබල මණ්ඩලයට වැඩිපුර ගෙවන ලද රු.33,900 ක් කලින් ගෙවීම් ගිණුම හර කරනු වෙනුවට සමුච්චිත අරමුදල් ගිණුම හර කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ගෙවන ලද අත්තිකාරම් රු.2,500 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) තණමල්විල සතිපොළේ කඩ කාමර 06 කින් ලැබිය යුතු රු.120,000 ක් ප්‍රාග්ධන ආදායම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දරන ලද ප්‍රවාහන වියදම් රු.453,389 ක් සදොස් ලෙස ගමන් වියදම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ඊ) සෙවනගල උප කාර්යාල ගොඩනැගිල්ල හා එහි පවතින කාර්යාල උපකරණ වල වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 03 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.1,479,479 ක් වූ අතර, උපයෝගී ලේඛන /වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.1,374,754 ක් විය.

### 1.3.3 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.2,480,395 ක් විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

#### තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.176,790 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.5 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි විධි විධානවලට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතී | |
| (i) | රීති අංක 14.1 | පරිපූරක ඇස්තමේන්තු අනුමත කර නොගෙන අයවැයගත ප්‍රතිපාදන ඉක්මවා රු.8,999,485ක වියදම් දරා තිබුණි. |
| (ii) | රීති අංක 193 | එක් එක් ආදායම් හා වියදම් විෂයයන් යටතේ වන අතිරික්තයන්/ඌණතාවයන් හා ඒ පිළිබඳ කරුණු පැහැදිලි කරන ප්‍රකාශයක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) | රීති අංක 217 | සභාවේ සියලුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව පී.එස් 46 ආකෘතිය ප්‍රකාර ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) | අංක 387 | සභාවේ අංක 506 සහ 2033 ගිණුම් වල මුදල් පොත් අනුව 2010 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු.436,992 ක හා රු.6,381 ක බැර ශේෂ විය. |
| (ii) | අංක 396 (ඇ) | 2010 දෙසැම්බර් 31 දිනට රු.22,078 ක් වටිනා කල් ඉකුත් චෙක්පත් 05 ක් සම්බන්ධයෙන් මෙම රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iii) | අංක 751 (1) | රු.508,589ක් වටිනා මිලදී ගැනිම්, තොග පොත් වලට ඇතුලත් කර නොතිබුණි. |

## 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,914ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,380,921ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට සහ ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු 000' | රු. 000' | රු. 000' | රු 000' | රු. 000' | රු. 000' |
| බදු කුලී | 3,425 | 4,015 | 590 | 3,504 | 3,257 | 247 |
| බලපත්‍ර ගාස්තු | 1,103 | 598 | 505 | 1,480 | 631 | 849 |
| වෙනත් ආදායම් | 16,537 | 27,812 | 11,275 | 13,262 | 15,666 | 2,404 |

#### 2.2.2 උසාවි දඩ මුදල්

විවිධ අඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණ 2ක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර පළාත් ආදායම් කොමසාරිස් වෙත එවා ඇති රු.1,500,000 ක උසාවි දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.112,800 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.2.4 හිඟ ආදායම්

ගවමස් කඩ කුලී, මාළු ලැලී, සති පොළ හා පොදු වැසිකිලි වලින් වර්ෂ ගණනාවක සිට හිඟව පවතින බදු කුලී රු.893,565 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාළ විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු | රු. | රු. | රු | රු. | රු. |
| | 000' | 000' | 000' | 000' | 000' | 000' |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 14,066 | 15,661 | (1,595) | 13,276 | 14,047 | (771) |
| අනෙකුත් වියදම් | 8,818 | 6,988 | 1,830 | 4,820 | 4,772 | 48 |
| උප එකතුව | **22,884** | **22,649** | **235** | **18,096** | **18,819** | **(723)** |
| ප්‍රාග්ධන වියදම | 5,200 | 7,539 | (2,339) | 8,690 | 1,735 | 6,955 |
| මුළු එකතුව | **28,084** | **30,188** | **(2,104)** | **26,786** | **20,554** | **6,232** |

## 2.4 අධිභාර

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (3) වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු අයවලුන්ට එරෙහිව මා විසින් පනවන ලද අධිභාර අනුව 2010 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණු අධිභාර අගය රු. 672,220 ක් විය.

## 2.5 මානව සම්පත් කළමනාකරණය

### 2.5.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 02 | 01 |
| ද්විතියක | 16 | 13 |
| ප්‍රාථමික | 25 | 23 |
| වෙනත් (අනියම්/තාවකාලික) | - | 27 |

### 2.5.2 අවිධිමත් පත්කිරීම්

ව්‍යාජ අධ්‍යාපන සහතික ඉදිරිපත් කිරීම මත පළාත් පාලන කොමසාරිස්වරයාගේ 2009 දෙසැම්බර් 21 දිනැති ලිපිය අනුව පත්වීම අවසන් කරන ලද ආදායම් පරිපාලක වරයකු සභාපතිවරයා විසින් 2010 ජනවාරි 01 දින සිට අනියම් මාර්ග කම්කරු තනතුරකට පත්කර 2010 දෙසැම්බර් 31 දින දක්වා වැටුප්, දීමනා, සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායක මුදල් ලෙස රු. 215,388 ක් ගෙවා තිබුණි.

## 2.6 වත්කම් කළමනාකරණය

### අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.1,287,861 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.133,804 ක් විය.

## 2.7 වාහන උපයෝජනය

(අ) රු.86,388 ක් වූ වාහන අලුත්වැඩියාවන් සම්බන්ධයෙන් මෝටර් රථ පරීක්ෂකගේ පෙර සහ පසු නිරීක්ෂණ වාර්තා ලබාගෙන නොතිබුණි.

(ආ) වීථි පහන් සවි කිරිම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය නොකර ලොරි රථයක් යොදාගෙන දින 18 ක් වෙනුවෙන් රු.45,000 ක් ගෙවා තිබුණි.

(ඇ) පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතියක් ලබා නොගෙන ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටියෙන් බැහැරව කුලී රථ යොදා ගැනීම වෙනුවෙන් රු.283,700ක් ගෙවා තිබුණ අතර, එයින් රු.181,700 ක් සභාපතිවරයාගේ දෛනික රාජකාරි ගමන් සඳහා දරන ලද බව දක්වා තිබුණි. කෙසේ වුවද රාජකාරි ගමන් තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි නොවීය.

## 2.8 හානි හා පාඩු

සේවක අර්ථ සාධක හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායක මුදල් පමාවී ගෙවීම නිසා සමාලෝචිත වර්ෂය තුළදී රු.15,769 ක අධිභාර ගෙවා තිබුණි.

## 2.9 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

විෂය භාර අමාත්‍යවරයාගේ හා පළාත් පාලන කොමසාරිස් වරයාගේ අනුමැතියකින් තොරව පෙර පාසල් ළමුන් හා පාලිකාවන්ට නිල ඇඳුම් ලබාදීම සඳහා 2010 මැයි 12 දින රු.1,008,262ක් සභා අරමුදලින් ගෙවා තිබුණ අතර ඌව පළාත් පාලන කොමසාරිස්වරයාගේ 2010 ජූලි 22 දිනැති ලිපිය මගින් මේ සඳහා සිය අනුමැතය ලබාදීම ප්‍රතික්ෂේප කර තිබුණි. 2010 නොවැම්බර් 03 වන විට ද මෙම නිල ඇඳුම් බෙදාහැර නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) සහ (ඕ) වගන්ති ප්‍රකාර අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතියක් නොමැතිව ගෘහසාධන වියදම් සඳහා සමාලෝචිත වර්ෂය තුලදී සභා අරමුදලින් රු.160,670 ක් වැය කර තිබුණි.

(ඇ) පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතියක් ලබා නොගෙන සභාවේ අනුමත සීමාව ඉක්මවා ඉන්ධන ලීටර් 383.12 ක් භාවිතා කර තිබුණි.

## 2.10 අවිධිමත් ගනුදෙනු

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14 සහ අදාල අත් පොතේ 2.14.1 වගන්තිය අනුව ප්‍රසම්පාදන ක්‍රියා මාර්ග අනුගමනය නොකර අවස්ථා 19 කදී රු.492,417 ක මිලදී ගැනීම් කර තිබුණි.

(ආ) අබලන් මාර්ග පිරිසකර කිරිම වෙනුවෙන් මෝටර්ග්‍රේඩර් කලිය සඳහා රු.961,421 ක් හා ඉන්ධන සඳහා රු.292,866 ක් කාර්මික නිලධාරි නිර්දේශ හා නිමි වැඩ වාර්තා රහිතව ගෙවා තිබුණි.

(ඇ) අනියම් පෙර පාසල් සහායිකාවකට ආයතන සංග්‍රහයේ 24 වැනි පරිච්ඡේදයේ 10.02 වගන්තියට පටහැනිව රු.50,000 ක ආපදා ණයක් ලබා දී තිබුණි.

(ඈ) අත්වැල් පාලමක් සකස්කිරිම සඳහා කාර්මික නිලධාරි නිර්දේශ හා නිමි වැඩ වාර්තා නොමැතිව රු.57,494 ක් ගෙවා පුද්ගලයෙකුගෙන් අහල් 1 1/4 ගණකම සහිත කුඹුක් ලෑලි වර්ග අඩි 323ක් මිලදී ගෙන ඒ සඳහා නිකුත් කරන ලද චෙක්පත් සභා ලේකම් නමින් ලියා ආදායකයා වෙත මුදල් ගෙවා තිබුණි.

(ඉ) මහවැලි අධිකාරියට අයත්ව තිබූ මහවැලි සංස්කෘතික කේන්ද්‍රය සභාව විසින් අත්පත් කර ගැනීමේදී පැවති හිඟ විදුලිය බිල්පත් වලින් රු.119,977 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ඊ) හිටපු සභාපතිවරයා ඉවත්ව යද්දී නිල දුරකථනය රැගෙන ගොස් තිබූ අතර නිල කාලය අවසන් වීමෙන් අනතුරුව ඔහු විසින් ලබාගෙන තිබූ රු.17,484 ක් වූ ඇමතුම් ගාස්තු සභාව විසින් ගෙවා තිබුණි.

## 2.11 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගොඩනැගිලි ඉදිකිරීම් බලපත්‍ර නිකුත් කිරීම සඳහා 2010 වර්ෂයේදී දෙවතාවක් පමණක් රැස්වූ සැලසුම් කමිටුව 2010 ජූලි මාසයෙන් පසු රැස්වී නොතිබුණි. 2010 වසරේ දී ඉදිරපත්වී ඇති ගොඩනැගිලි අයදුම් පත්‍ර 19 න් 05 ක් පමණක් සැලසුම් කමිටුවට ඉදිරිපත් කර ඇති අතර ඉතිරි 14 සභාපතිවරයා විසින් පෞද්ගලිකව අනුමත කර තිබුණි.

(ආ) අනවසර පදිංචි කරුවන් ඉවත් විය යුතු බවට නඩු තීන්දුවක් මගින් ප්‍රකාශ වී ඇත සභාවට අයත් ඉඩමක අනවසර පදිංචි කරුවන් ඉවත්කර දේපළ නිරවුල් කර ගැනීමට සභාව විසින් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) 2005, 2006 වර්ෂ වලට අදාල එකතු කළ අගය මත බදු රු.237,241 ක් 2010 නොවැම්බර් 03 වන විටත් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඈ) මහගම සතිපොලෙහි 2010 වර්ෂයේ අගෝස්තු, සැප්තැම්බර් හා ඔක්තෝබර් යන මාසයන්හි ජල බිල්පත් වල රු. 6,228 ක බැර ශේෂයක් තිබියදී ගෙවීම් කිරීම නිසා රු.18,654 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අය කරන ලද රු.8,354 ක් පළාත් පාලන කොමසාරිස් වෙත යවා නොතිබුණි.

(ඊ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 වගන්තිය ප්‍රකාරව රු.1,374,353 ක් වටිනා මිලදී ගැනීම් සඳහා රු.68,718 ක් වූ රඳවා ගැනීමේ බදු අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(උ) දිවා කාලයේ දී කාර්ය මණ්ඩලයක් සේවයේ යෙදී සිටියදී සෙවනගල උප කාර්යාලයේ දිවා කාලය සඳහා ද මුරකරුවෙකු යොදවා තිබුණි.

(ඌ) සෙවනගල පෙර පාසලෙහි සිටින ළමුන් සංඛ්‍යාව 40 ක් පමණක් වුව ද අතියම් පෙර පාසල් පාලිකාවන් 03 දෙනෙක් පත්කර තිබුණි.

## 2.12 අභ්‍යන්තර විගණනය

-----------------------------

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

## 03. පද්ධති හා පාලන

-------------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය